පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 08 |

# අවසාන වාර පරීක්ෂණය - 2019
## සිංහල භාෂාව හා සාහිත්‍යය - I , II

පාසලේ නම : ......................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................  කාලය : පැය 02 යි.

## I කොටස

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත්ම සමීප අර්ථය දෙන පදය තෝරන්න.**

01. වැහි පොද වැටෙද්දී අම්මා <u>ලහිලහියේ</u> නිවසට පැමිණියා ය.

1. ඉතා ඉක්මනින් 2. ඉතා සෙමෙන්
3. අලසව 4. ලණුවක් රැගෙන

02. කරීක තරගයේ ප්‍රතිඵල ඇසූ නිමල්ගේ <u>ඉහේ මලක් පිපුණි</u>.

1. හිසේ මල් පිපීම 2. දැඩි සතුටක් ඇතිවීම
3. වේදනාවක් ඇතිවීම 4. පුදුමයක් ඇතිවීම

03. සඤ්ඤක අක්ෂරයක් යෙදී ඇති වරණය වන්නේ,

1. කළය 2. ප්‍රතිඵල 3. සුවඳ 4. ප්‍රෞඪ

04. අක්ෂර වින්‍යාසය වැරදි ලෙස යෙදී ඇති පිළිතුර තෝරන්න.

1. වීරෝදාර 2. කණිෂ්ඨ
3. පරිගණකය 4. කෘත්‍රිම

05. අකාරාදි පිළිවෙළ නිවැරදි ව යෙදී ඇති වරණය වන්නේ,

1. ඇතා,ගවයා, අශ්වයා,නරියා 2. කතරගම,කෑගල්ල ,කුරුණෑගල ,කොළඹ
3. ගයන්ත, ගනිඳු, ගවේශ, ගරුක 4. රඹුටන්, අනෝදා,ජම්බු,ඇපල්

- **ඉරි ඇඳි පදය අයත් ක්‍රියා වර්ගය වන්නේ ,**

06. නොසෑහෙන අශිෂ්ට බස් <u>නොදොඩව</u> වනචරය ,

1. ප්‍රයෝජ්‍ය ක්‍රියා 2. මිශ්‍ර ක්‍රියා 3. පූර්ව ක්‍රියා 4. විධි ක්‍රියා

07. පියසේන වටපිට <u>බලමින්</u> වීථියෙහි වේදිකාව දිගේ ගමන් කළේ ය.

1. මිශ්‍ර ක්‍රියා 2. අසම්භාව්‍ය ක්‍රියා 3. ආශීර්වාද ක්‍රියා 4. පූර්ව ක්‍රියා

- **මුලින් දී ඇති පදයට බහ්වර්ථ පදයක් නොවන්නේ ,**

08. තුරු

1. තරු 2. තුර්ය 3. ගස් 4. අක්ෂි

09. නා

1. ඇතා 2. නරියා 3. නාගයා 4. නායකයා

10. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

1. තොල්-ලවන් 2. අරවින්ද-සියපත
3. ශ්වේත-ස්වර්ණ 4. අනවරත-නිරන්තර

11. මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් ඇතුළත්වන පදය වන්නේ ,

1. භාග්‍ය-වාසනාව 2. මෘදු-රළු 3. සතුට-සොම්නස 4. අකුසල්-පව්

12. අපි නිරතුරුව ම සුදන ඇසුරට යොමුවෙමු. මෙහි ඉරි ඇඳි පදය,

1. නිපාතයකි
2. උපසර්ගයකි
3. උපමාවකි
4. ක්‍රියා පදයකි

13. අනුක්ත සර්ව නාම පදයක් වන්නේ,

1. මම 2. තොප 3. අපි 4. ඔවුහු

14. ''දික් දිගට කොළ ඇති- කන්නන්ට රස ඇති දෙන්නන්ට අකමැති'' යන තේරවිල්ලෙන් කියවෙන්නේ,

1. උණ 2. උක් 3. අඹ 4. රඹුටන්

15. A. තද්ධිත නාම - E. හතළිස් අට

B. සමාස නාම - F. ගුරුදෙගුරු

C. අනුමානය - G. හේතු අනුව යමක් සිතා ගැනීම

D. අටසාළිස් - H. බුද්ධිමත්

නිවැරදි ලෙස අක්ෂර ගළපා ඇති වරණය වන්නේ,

1. A , E සහ B , F
2. B , F සහ C, G
3. D ,H සහ A, E
4. B , F සහ D, H

- **පහත දක්වා ඇති වාක්‍යවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

16. ____________________ මිහිරි ලෙස ගීයක් ගායනා කළා ය.

1. ගායිකාවක 2. ගායිකාවක් 3. ගායිකාවන් 4. ගායිකාවෝ

17. වැද්දා _____________ පසුපස ලුහුබැන්දේ ය.

1. මුවෙක් 2. මුවෝ 3. මුවෙකු 4. මුවදෙනක්

- **හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

18. මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියෝ ස්ථානෝචිත ප්‍රඥා ඇතිව__________ප්‍රතිවාදීන්ට මුහුණ දුන් හ.

1. අවකිතව
2. ආරක්ෂාවෙන්
3. ගවේෂණයෙන්
4. නිරික්ෂණයෙන්

19. "තම තරම දැන ගෙන- නොපැවතුණ හොත් සැම තැන

මීයාට වූ මෙන - බියයි වන්නේ නොසිතූ විලසින"

මෙම කවිය ඇතුළත් වන්නේ.

1. බුදු ගුණ අලංකාරයේ
2. ශික්ෂා මාර්ගයේ
3. පරාස්ස නාට්‍යයේ
4. දහම්ගැට මාලාවේ

20. "මනමේ'' නාට්‍ය රචනා කරන ලද්දේ,

1. එදිරිවීර සරච්චන්ද්‍ර මහතා
2. හෙන්රි ජයසේන මහතා
3. රෝහණ බැද්දගේ මහතා
4. රෝහණ දන්දෙණිය මහතා

( ලකුණු 2 x 20 = 40 )

# II කොටස

1. පහත මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 200 කට නොඅඩු වන සේ රචනාවක් ලියන්න.

i. රකිමු අපි පරිසරය. අප රකියි පරිසරය.
ii. රූපවාහිනිය සහ ළමා පරපුර
iii. පොදු දේපළ සුරැකීම අපේ යුතුකමකි.
iv. ගුරුවරු අපගේ දෙවිවරු ය.

(ලකුණු 20 යි)

2. පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. මට දැන් ඉස්කෝලේ ගිහින් මගේ යහළුවන්ටත් ඒ දේවල් කියාදෙන්න පුළුවන්.
අ) ඉහත පාඨය උපුටාගත් පාඩමේ නම ලියන්න.
ආ) මෙසේ ප්‍රකාශ කළේ කවරෙක් ද?
ඇ) මෙසේ කීවේ කා හට ද?

ii. " මේක නම් හරි ඇබැද්දියක් හාමුදුරුවනේ "
අ) ඉහත පාඨය උපුටාගෙන ඇති කෙටිකතාවේ නම කුමක් ද?
ආ) එහි රචකයා නම් කරන්න.
ඇ) මෙහි ' හාමුදුරුවනේ ' යනුවෙන් ආමන්ත්‍රණය කරනු ලබන්නේ කා හට ද ?

iii. "තමුන්නාන්සේ ඇයි මොකද මේ වෙවුලනව නේද?"
අ) ඉහත ප්‍රකාශය කරනු ලබන්නේ කවුරුන් විසින් ද?
ආ) මේ හා බැඳි අවස්ථාව ලියන්න.
ඇ) ඉහත පාඨය හා සම්බන්ධ මුල් කෘතියෙහි කතුවරයා නම් කරන්න.

iv. කරන කලට පව් මීරිය මී සේ
විඳින කලට දුක් ඇඩි වෙයි ගිනි සේ
ඇඳින එපව් දුරලන උපදේසේ
..............................................................................

අ) ඉහත කවියේ ඉතිරි පදය සම්පූර්ණ කරන්න.
ආ) මෙම කවිය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය සඳහන් කරන්න.
ඇ) මෙහි සඳහන් "මී සේ " යන්නෙහි අර්ථය කුමක් ද?

v. "වළං කටු කැලි ගොඩක් තියෙනවා වගේ පේනවා"
අ) ඉහත ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම ලියන්න.
ආ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් විසින් ද?
ඇ) මෙසේ ප්‍රකාශ කරන්නේ කවුරුන් සමඟ ද?

(ලකුණු 3 x 5 = 15 යි)

3. පහත දැක්වෙන පද්‍ය කොටස ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අඹර පියඹා යන සියොත් පෙළ
දියඹ පීනා යනෙන මින් රැළ
නෙක් රුවින් නෙක් වනින්
බෙදී ගිය විලසා

බෙදෙනු කිම එක මිහි මවකගේ
කුස උපත ලද මිනිසා

i. මෙහි එන " අඹර පියඹා යන සියොත් පෙළ " යන්නෙහි අර්ථය ලියන්න.
ii. මෙහි සඳහන් සමූහාර්ථවාචී පද දෙකක් ලියා දක්වන්න.
iii. මුහුදේ ගැඹුරු ස්ථානය යන අදහස දෙන වචනය ඇතුළත් කවි පදය උපුටා දක්වන්න.
iv. විවිධ ' වර්ණයෙන් ' යන්නට සමාන වචන යුග්මය පැදි පෙළින් තෝරා ලියන්න.
v. මෙම පද්‍යයෙන් රචකයා සමාජයට දෙනු ලබන පණිවිඩය කුමක් ද?

(ලකුණු 2 x 5 = 10 යි)

4. ඔබ ඔබගේ ගම් ප්‍රදේශයට අයත් යොවුන් සමාජයේ ලේකම් යැයි සිතා එහි මූලිකත්වයෙන් සිදුකෙරෙන "මත් උවදුර පිටුදැකීම" පිළිබඳ වැඩසටහනට සමගාමීව ප්‍රජාව දැනුවත් කිරීමේ දේශනයක් පැවැත්වීමට ආරාධනා කරමින් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා වෙත යවන රාජකාරී ලිපිය ලියන්න.

නැතහොත්

ඔබ ප්‍රදේශයේ ඇති ක්‍රීඩා සමාජයක සාමාජිකත්වය ලබා ගැනීම සඳහා සුදුසු ජීව දත්ත පත්‍රිකාවක් පිළියෙල කරන්න.

(ලකුණු 15 යි)

**අවසාන වාර පරීක්ෂණය -2019**

**පිළිතුරු පත්‍රය (8 ශ්‍රේණිය)**

**සිංහල භාෂා හා සාහිත්‍යය**

# I කොටස

| ප්‍රශ්න අංක | පිළිතුරු අංක | ප්‍රශ්න අංක | පිළිතුරු අංක |
|---|---|---|---|
| 1) | i | 2) | ii |
| 3) | iii | 4) | ii |
| 5) | ii | 6) | iv |
| 7) | i | 8) | iv |
| 9) | ii | 10) | iii |
| 11) | ii | 12) | ii |
| 13) | ii | 14) | ii |
| 15) | ii | 16) | ii |
| 17) | iii | 18) | i |
| 19) | ii | 20) | i |

# II කොටස

2)

i. අ) අලුත් අවුරුදු උත්සවය

ආ) පුතා

ඇ) තාත්තාට

ii. අ) පෙත්සමා

ආ) ලීලි ගුණසේකර

ඇ) ඒජාන්ත උන්නාංසේ

iii. අ) පූර්ණක විසින්

ආ) පුංචිරාල / ගමරාලගේ ගෙදරට යන

අවස්ථාවේ (පූර්ණක සහ කාළහීෂණ)

ඇ) ඒ.පී. ගුණරත්න මහතා

iv. අ) නුදුන මැනවි තුන්දොර අවකාසේ

ආ) ලෝවැඩ සඟරාව

ඇ) මී පැණි වගේ

v. අ) සයුරු ගැබෙන් මතු වූ නැව

ආ) තරුණ කිමිදුම්කරුවා

ඇ) පුරා වි. දෙපාර්තුමේන්තුවේ ස්ථාන

භාර නිලධාරියා

3)

i. අහසෙහි පියඹා යන කුරුලු රංචු

ii. පෙළ , රැළ

iii. දියඹ පීනා යනෙන මීන් රැළ

iv. නෙක් වනින්

v. මිනිසුන් ජාති ආගම් වශයෙන් නොබෙදී

එක් මවකගේ දරුවන් ලෙස සිටිය යුතු බව

(මේ හා සමාන පිළිතුරු)